# ප්‍රභාකරන් මෙල්ල නොකර

ප්‍රභාකරන් තම මිනීමැරුම් උත්සන්නකර ඇත. දින කිහිපයක් ඇතුළත ඔහු ක්ලෙමෝ බෝම්බ පුපුරුවා හමුදා සෙබළුන් දහහත්දෙනකු මරාදමා ඇත. ප්‍රභාකරන් මේ කරන්නේ නිරායුධ මිනිසුන් මරාදැමීමකි. ඔහු හමුදාවේ ද සෙබළුන් මරණ බව සැබෑ ය. එහෙත් අද හමුදාව ඊනියා සටන්විරාම ගිවිසුමක් මගින් රනිල් වික්‍රමසිංහ විසින් සියළු කාර්යයන් සඳහා නිරායුධකෙරී ඇත. හමුදාව ඒ අයුරින් නිරායුධකිරීම ගැන රනිල් වික්‍රමසිංහ හැරෙන්නට  වගකිවයුත්තේ නෝර්වේ ය. එයට උල්පන්දන් දුන්නෝ රාජ්‍ය නොවන සංවිධානවල කුලීකාර බැලයෝ, දහනවවැනි සියවසේ ජීවත්වන කසිකබල් මාක්ස්වාදියෝ, නැවත උපන් ක්‍රිස්තියානි ව්‍යාපාරිකයෝ, කඩමාළු පුවත්පත්වල කතෘමණ්ඩලවල සේවයකරන්නෝ, ව්‍යාජ උගත්තු ආදීහු ය. එහෙත් මෙයින් අදහස්වන්නේ මහින්ද රාජපක්ෂ මහතාගෙ ආණ්ඩුවට ඒ පිළිබඳ ඇඟැකණ පියාගෙන සිටියහැකි බව නො වෙයි. මහින්ද රාජපක්ෂ මහතාට හා සන්නද්ධ බලකායන්ට අද මහත් වගකීමක් පැවරී ඇත. වහාම ප්‍රභාකරන් වැනසිය යුතු ය. බටහිරයන් විසින් නඩත්තුකෙරෙන මේ නිවට කෑණහිලා පරාජයකිරීම අපේ හමුදාවට අසීරු කරුණක් නො වෙයි.

තම ඊනියා මහාවිරු කතාවෙන් හෙවත් උපන්දින කතාවෙන් මහින්ද රාජපක්ෂ මහතාගෙ ආණ්ඩුවට ඊනියා ප්‍රශ්නය විසඳීමට යම් කාලයක් ලබාදෙන බව ප්‍රභාකරන් පැවසී ය. ප්‍රභාකරන්ගෙ කතාව ඇසීමෙන් පසු මෙරට පණ්ඩිතයන් කිහිප දෙනකු කීවේ නොබෝ කලකින් ම යුද්ධය පටන්ගන්නා බව ය. එහෙත් මේ ඊනියා යුද්ධ කතාව දැන්වත් නැවැත්විය යුතු ය. කොටි සංවිධානයට අද දැනට වසරකට පෙර තිබූ ශක්තියවත් නැත. නව හමුදාපති සරත් ෆොන්සේකා මහතා ප්‍රකාශකර ඇති ආකාරයට කොටි ත්‍රස්තවාදී නඩය භාරදහකට පන්දාහකට පමණ සීමාවෙයි. ඔවුන්ට එදාවත් හමුදාව සමග මුහුණට මුහුණ ලා සටන්කිරීමේ හැකියාවක් නො වී ය. අද කෙසේවත් නැති බව හමුදාපති ෆොන්සේකා මහතා ම පවසා තිබුණි. කොටි එදත් අදත් කරන්නේ මිනීමැරීම ය. එහි දී ඔවුහු නිරායුධ රටවැසියන් ද මරාදමති. කොළඹ බෝම්බ පිපිරෙව්වේ අහිංසක ජනයා මරාදැමීමට ය. එය කිසිසේත් ම යුද්ධයක් නො වෙයි. අනෙක් අතට මේ රටවල් දෙකක් අතර කෙරෙන යුද්ධයක් ද නො වෙයි. කොටි තැන තැන සැඟ වී සිට මිනීමරති. දැන් අළුතින් යුද්ධයක් පටන්ගෙන නැත. කොටි වියරුවෙන් මිනීමැරීම උත්සන්න කර ඇත.

ඊනියා සටන්විරාමය ව්‍යාජයක් වුයේ ද අද පමණක් නොව එදා ද යුද්ධයක් නොමැති වූ බැවින් ය. සටන්විරාමයක් තිබිය හැක්කේ යුද්ධයක් කරන දෙපාර්ශවයක් අතර ය. මිනීමරණ සංවිධානයක් හා එය වැලැක්වීමට කටයුතුකරන රාජ්‍යයක් අතර සටන්විරාමයක් ඇතිකිරීම යන්න සංකල්පීය වශයෙන් ම වැරදි ය. මිනීමරු නඩයකට කොන්දේසි පැනවීමට රාජ්‍යයකට නො හැකි ය. ඔවුහු මිනීමැරීම අත්නොහරිති.  ඊනියා සටන් විරාමය නිසා අපේ හමුදාවට ප්‍රශ්නයක් වී ඔවුන් බැරැක්කවලට පමණක් සීමාවිය. එහෙත් කොටි සංවිධානයකට ඒ ප්‍රශ්නයක් නො වෙයි. ඊනියා සටනවිරාම ගිවිසුම ඔවුන්ට බලනොපාන බැව පැහැදිලි ය. රනිල් වික්‍රමසිංහ කෙළේ ඊනියා සටන්විරාමයක් ඇතිකර, හමුදාව  අකර්මණ්‍ය කිරීම ය. එහෙත් නොටි රිසි සේ මිනීමැරූහ ; මිනීමරති. අද රනිල් වික්‍රමසිංහ කොටි ඝාතන පිළිබඳ ව ආණ්ඩුව විවේචනයකරයි. ඔහු කළයුතුව තිබුණේ කොටි හෙළාදැකීම ය. එහෙත් ඔහු එසේ නො කරයි. ඒ අතර ඔහු කළයුත්තේ ඊනියා සටන්විටරාම ගිවිසුමක් ඇතිකිරීම පිළිබඳ ස්වයංවිවේචනයක යෙදීම ය.

නෝර්වේ ඇතුළු බටහිර ජාතිකයන්ට අවශ්‍යවුයේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිකරවීම ය. එහෙත් කොටින්ගෙ ඡන්ද වර්ජනයෙන් ඒ පැතුම සුන්වි ය. මහින්ද රාජපක්ෂ මහතා ජයග්‍රහණයකළ විගස සොල්හයිම් ප්‍රකාශකෙළේ දැන් පාලනය නොකළහැකි සිද්ධි ඇතිවේවිය කියා ය. උතුරේ අද මිනීමැරම් උත්සන්න වී ඇත. සොල්හයිම්ලා එයට වගකිව යුතුවෙයි. ඒ එවැනි අනාවැකියක් කීම නිසා ම නොව ඊනියා සටන්විරාම ගිවිසුම යටතේ කොටින්ට මිනීමැරීමට ඉඩ සලසාදීම හේතුවෙන් ය. අද මෙරට නවත්වා තිබෙන නෝර්වීජියානු හා වෙනත් ස්කැන්ඩිනේවියානු ජාතිකයන්ගෙන් සමන්විත නිරීක්ෂන කමිටුව මේ මිනීමැරුම්වලින් පසුව කරන්නේ දෙපැත්තම එවැනි ක්‍රියාවලින් වැළකිය යුතු බවට බයිලා කීම ය. ඔවුහු කොටි සංවිධානය හෙළා නොදකිති. කොටි රනිල් වික්‍රමසිංහ මෙන් ම බටහිරයෝ ද එකම කඳවුරේ වෙති. ඒ එසේ නම් කොටි රනිල් වික්‍රමසිංහට ඡන්දය නොදී ජනාධිපතිවරණය වර්ජනය කෙළේ ඇයි දැයි යමකු ප්‍රශ්නකිරීමට ඉඩ ඇත. කොටි ඡන්දය වර්ජනයකිරීම පිලිබඳ විවිධ අර්ථකථන සැපයී ඇත. මේ තීරුවෙන් ද යම් අර්ථකථනයක් සැපයිණි. එහෙත් ඒ සියල්ල අනවශ්‍ය සංකිර්ණ අර්ථකථන වෙයි.

© Prof. Nalin De Silva

කොටින්ගේ ඡන්ද වර්ජනය ද, ප්‍රභාකරන්ගේ උපන්දින කතාව ද, ඇන්ටන් බාලසිංහම් ලන්ඩනයේ සිට කළ කතාව ද, දැන් මිනීමැරුම් උත්සන්න කිරීම ද එකම එක සරල හේතුවක් නිසා සිදුවෙයි. දෙමළ ජාතිවාදීන් වෙනම රටක් සඳහා කරන ඊනියා සටනට අවුරුදු හැටකට පමණ පසුව ද, ප්‍රභාකරන් පමණක් නොව වෙනත් දෙමළ ත්‍රස්තවාදීන් ද ඊළමක් සඳහා අවිගෙන අවුරුදු තිස්තුනකට පමණ පසුව ද, ඊලම හා ඒ යුක්තියුක්තකිරීම සඳහා ගොතන ලද ඊනියා නිජබිම් සංකල්පය, දෙමළ ජාතියක් ඇතැයි යන බොරු සංකල්පය, ස්වයංනිර්ණ අයිතිය ආදී කෙප්ප රැගත් වඩුගොඩ සම්මේලනයට අවුරුදු තිහක් පිරීමෙන් පසුව ද පිහිටුවාගත් ඊළමක් නැත. දෙමළ ජාතිවාදීන් දෙමළ රාජ්‍යයක් ගැන කතාකිරීමට පටන්ගත්තේ 1947 දී බව බොහෝ දෙනා නො දනිති. දන්නෝ ඒ බව සඟවති. චෙල්වනායගම් ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය ආරම්භකෙළේ ඒ වසරේ දී ය. සියල්ල පටන්ගත්තේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කිරීමෙන් පසුව යැයි කියන්නන්ට දෙමළ රාජ්‍ය පක්ෂය එයට අවුරුදු නවයකට පෙර ඇතිවීම තේරුම්කරදිය හැකි නො වෙයි. ඒ බව මතක්කළ විට ඔවුහු කිපෙති. දෙමළ ජාතිවාදයේ ආරම්භය 1947ටත් එහාගොස් දහනවවැනි සියවසට දිවයන බව ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා නම් පොතෙහි අපි සඳහන් කෙළෙමු. දෙමළ ජාතිවාදය ආරම්භ කරන ලද්දේ දහඅත්වැනි සියවසේ දී ලන්දේසීන් විසින් බව අපි දැන් දනිමු. කෙසේ වෙතත් අවි අතට ගෙන අවුරුදු තිස්තුනකට පමණ පසුවත් ප්‍රභාකරන්ට ඊළමක් පිහිටුවීමට නොහැකි වී ඇත. ඊළම කෙසේවෙතත් අද ප්‍රභාකරන් ජීවත්වන්නේ එක්සත් ජාතික පක්ෂය හා චන්ද්‍රිකා කුමාරතුංග නිසා ය. බටහිරට හා වෙනත් විදේශීය බලවේගවලට නොනැමෙන නායකයකුට ප්‍රභාකරන් පැරදවීම අසීරු කරුණක් නො වෙයි.

ප්‍රභාකරන්ට දැන් තම ත්‍රස්තවාදී කණ්ඩායම පවත්වාගෙන යෑම ප්‍රශ්නයක් වී ඇත. අද වන විට ඔහුට වයස අවුරුදු පණස් එකක් වෙයි. ඔහුට තව උපන්දින උත්සව රැශියක් පැවැත්වීමට ඉතිරි වී නැත. ඔහු තවදුරටත් තරුණයෙක් නො වෙයි. ත්‍රස්තවාදියෝ  ඊළම ඉල්ලති. එහෙත් ප්‍රභාකරන්ට ඊළමක් දීමට නො හැකි ය. අනෙක් දෙමව්පියන්ගේ දරුවන් බලහත්කාරයෙන් ත්‍රස්තවාදී ව්‍යාපාරයට බඳවාගන්නා ප්‍රභාකරන් තම පුතාට පිටරට විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබාදෙන බැව් පැවසෙයි. ඔහු පිළිබඳ අද ප්‍රසාදයක් දක්වන්නේ, ඔහු වෙනුවෙන් පෙනී සිටින්නේ, දෙමළ ජනයාට වඩා රාජ්‍ය නොවන සංවිධානවල බැළ මෙහෙකම්කරන ව්‍යාජ සිංහල උගතුන් හා දහනවවැනි සියවසේ ජීවත්වන කසිකබල් මාක්ස්වාදීන් වැනි පිරිස් ය. ඒ හේතුවෙන් ප්‍රභාකරන්ට කළහැක්කේ තම නායකත්වය පවත්වාගෙන යෑම සඳහා යම් යම් ක්‍රියාවල නිරතවීම පමණ ය. උපන්දින කතාවේ දී පාරම්බෑම, ඡන්ද වර්ජනය හා මිනීමැරුම් උත්සන්නකිරීම එවැනි ක්‍රියා ය. බාලසිංහම් ලන්ඩනයේ සිට උඩුබුරා ඇත්තේ ද නායකත්ව අරගලයක් හේතුකොටගෙන ය. ඔහුට අද තමිල්සෙල්වම් තර්ජනයක් වෙයි. එබැවින් ඔහු ප්‍රභාකරන්ට ද ඉහළින් ගොස් සිංහලයන්ට හා මහාවංසයට තඩිබායි. ඔහු ඒ අතර තමිල්සෙල්වම් තායිලන්තයේ දී ඊනියා සාම සාකච්ඡා පැවැත්වීමට ගණිකා මඩම්වලට ගිය බව පවසයි. අවිගත් අරගලය පසෙකලා ලිංගික අරගලයක නොයෙදුණේ තමා පමණක් බවත් ඔහු කියයි. මේ සියල්ල කොටි සංවිධානයෙහි තම වැදගත්කම රැකගැනීමට කරන දෑ ය. අද මිනීමැරුම් උත්සන්න කිරීමෙන් පෙනී යන්නේ කොටින්ගේ ශක්තිය නොව දුර්වලකම ය. ඇතැම්විට ඔවුන් කොළඹ ද නැවතත් ක්‍රියාකාරීවීමට ඉඩ ඇත. එහෙත් අප ඉන් පසුබට විය යුතු නො වෙයි. කළ යුත්තේ මේ කැණහිළුන්  හමුදාක්‍රියා මාර්ගවලින් විනාශකර දැමීම ය. කොටි අද නිරත වී ඇත්තේ සියදිවි නසාගැනීමේ ක්‍රියාවලියක ය. ඒ කිසිසේත්ම ඔවුන්ගේ ශක්තියක් නිසා සිදුවන්නක් නො වෙයි.

ඊනියා සටන්විරාම ගිවිසුම අත්සන්කළ දිනයේ සිටම කොටි එය කඩා ඇත. ඔවුන් ගිවිසුමෙන් ඈත්වන බව ප්‍රසිද්ධියේ නො කීව ද ඔවුහු එය කඩති. ඊනියා නිරීක්ෂණ කණ්ඩායම කරන නිරීක්ෂණයක් නැත. ඔවුන් අද බලාසිටින්නේ ආණ්ඩුව ඊනියා ගිවිසුම කඩන තුරු ය. ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ ආණ්ඩුව ගිවිසුම කැඩූ බව නිල වශයෙන් ලෝකයට කීම පමණකි. ආණ්ඩුව ඒ ගැන තැකිය යුතු නො වෙයි. බටහිරයන් ආණ්ඩුවට චරිත සහතික නිකුත් නොකරනු ඇත. අද කළ යුත්තේ සොල්හයිම් මෙරටට වැද්ද නොගතයුතු පුද්ගලයකු (පර්සනා නොන්ග්‍රාටා) ලෙස නම්කිරීමත්, නිරීක්ෂණ කමිටුව ආපසු ඇරීමත්, මහින්ද චින්තන කොන්දේසි මත පමණක් සාකච්ඡා ඇරඹීමට කතාකිරීමත්, ඒ අතර බටහිරයන්ට හා ඊනියා ලෝක ජනමතය නමින් ක්‍රියාත්මක වන බටහිර ජනමාධ්‍ය හා දේශපාලකයන් නිර්මානයකරන මතයට බිය නොවී හමුදා ක්‍රියාමාර්ග වහාම ඇරඹීමත් ය. හමුදාව ඇත්තේ බලුකපුටන් මෙන් මැරෙන්නට නොව සතුරා විනාශකර රට දැය සමය සුරැකීමට බව නව ජනාධිපතිතුමාටත් නව හමුදාපතිතුමාටත් මතක්කළ යුතු නො වෙයි.

© Prof. Nalin De Silva